# හිඟන්නා සහ පාන් කාල





## පමා නොවී එවි අකුරට

ආනන්දයේ මා සමග එකට උගත් උෂාද් සහ මා අතර ඇති කර ගත් රුපියල් පහක ඡන්ද ඔට්ටුවකින් මට පහසුවෙන් දිනුම අත් වූ (ඔක්තෝබර් 2009 සන්නස බලන්න) 1977 මැතිවරණය ලංකා ඉතිහාසයේ අති තීරණාත්මක එකක් වූ බවට කිසිදු පැකිලීමකින් තොරව කිව හැක.

ඊට වසර හතකට පෙර 1970 දී පැවැත්වුනු මහ මැතිවරණයෙන් විශිෂ්ඨ ජයක් ලැබූ සිරි ලංකා පක්ෂයේ නායකත්වයෙන් සහ සමසමාජ, කොමිනිස් කාරයින් ගේ සහභාගීත්වයෙන් පිහිටුවා ගෙන තිබූ සමගි පෙරමුණ රජය පරදවා, ආසන එකසිය හතලිස් හතරක පාර්ලිමේන්තුවේ ඒ වන විට ආසන දහ අටකට පමණක් සීමා වූ සුළුතර පක්ෂයක් බවට පත්වී සිටි යූ.ඇම්.පී ය විසින් මෙම 1977 මැතිවරණයේ දී අති විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා ගන්නා ලදී. එය තුනෙන් දෙකේ බහුතරයකටත් ඔබ්බට ගිය හයෙන් පහේ දිනුමක් විය. තම සමගිය බිඳී, සමගි පෙරමුණ කැඩීගොස් තිබූ හෙයින් වෙන් වෙන්ව තරග වැදුණු සිරි ලංකා පක්ෂය පමණක් ආසන අටක් දිනාගත් අතර සමසමාජ සහ කොමිනිස් කාරයෝ ඇතුළු වාමාංශික පක්ෂ පාර්ලිමේන්තුවෙන් අතුගෑවී, කුජීතු වී ගියෝය. විරුද්ධ පක්ෂ නායකත්වය හිමි වූයේ ද ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ අමිර්තලිංගම් ට මිස සිරි ලංකා පක්ෂයේ නායිකා සිරිමා ට නොවේ.

මෙලෙස යූ.ඇම්.පී ය ජය ලබන්නට මූලික හේතුව නම් සමගි පෙරමුණ රජය කාලයේ පැවති අත්‍යවශ්‍ය භාණ්ඩ වල හිඟය සහ ඉහල ගිය බඩු මිල නිසා ඇතිවී තිබූ ජනතා අප්‍රසාදයයි. හැත්තෑව දශකයේ මුල් භාගයේ ඔපෙක් සංගමය පිහිටවීම නිසා ඉන්ධන මිල ඉහල යාමද, රජය විසින් පනවා තිබූ ආනයන සීමා ද මේ භාණ්ඩ හිඟයට සහ ඉහල මිලට හේතු සාධක විය. සීනි, පාන් පිටි, හාල්, කිරි පිටි ආදිය බෙද හැරුණේ සලාක ක්‍රමයටයි. ගමේ ගොඩේ කඩවල තේ බිව්වේ හකුරු සමගය. බොහෝ නිවෙස් වල ද මාසේ මැද වෙන විට සීනි සලාකය අවසාන වන නිසා අත්ලට ගත් සීනි පුපුරු ටිකක් සමග කහට තේ බොන්නට ජනතාවට සිදුවිය. තිරිඟු පිටි සහ පාන් ලැබුනේද සලාක ක්‍රමයටය. හාල්පොත ද, සමූපකාර කාඩ් එකද, පාන් කාඩ් එකද, භූමිතෙල් කාඩ් එකද යනාදී වශයෙන් කාඩ් පත් විශාල සංඛ්‍යාවක් අපට තිබුණි. මෙයට අමතරව අද ජීවිතයේ අනිවාර්ය අංගයක් බවට පත්වී ඇති ජාතික අනන්‍යතාපත්‍රය හෙවත් නැෂනල් අයිඩෙන්ටිටි කාඩ් එක ද නිකුත් කර තිබුණි.

බඩු මිල පිළිබඳ හොඳම දර්ශකය වූයේ පාන් ගෙඩියක මිලයි. මැතිවරණ සමය වන විට පාන් ගෙඩියක් මිල රුපියලක් විය. එනම් පාන් කාලක් ශත විසිපහකි.

මැතිවරණයේ දී යූ.ඇම්.පී යේ ප්‍රධාන ඡන්ද පොරොන්දුව වූයේ බඩු මිල අඩු කිරීමයි. සලාකයට ලැබෙමින් තිබූ හාල් සේරු දෙක වෙනුවට ධාන්‍ය රාත්තල් අටක් දෙන්නටද, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වල මිල අඩු කිරීමට ද යූ.ඇම්.පී. ය පොරොන්දු දුනි.

මින් වසර දහතකට පසු දිනයක, 1994 මහ මැතිවරණයේ පසුබිම යටතේ, නුගේගොඩ දී පැවැත්වුණු කලාකරුවන් ගේ දේශපාලන රැස්වීමක දී කථා කළ ලූෂන් බුලත්සිංහල ලංකාවේ කෙරෙන මේ ඡන්ද පොරොන්දු දීම ගැන සඳහන් කරමින් අපේ රටේ ඡන්දදායකයින් සමාන කළේ "බා, බා, බා" යයි හඬ නගා වී ටිකක් විසිකරන විට දුව එන කිකිළියන් රංචුවකට ය!

බඩු මිල අඩු කරනවාය යන පොරොන්දුව ප්‍රායෝගික එකක් වන්නේ කෘතිම ලෙස ඉහල දමන ලද මිලක් පවතී නම් පමණි. බඩු හිඟයකදී ඉල්ලුම සහ සැපයුම අතර ඇතිවන තත්වය මත ස්වභාවික වෙළඳ පොලක නම් බඩු මිල ඉහල යාම සාමාන්‍ය දෙයකි. අඩු සැපයුම කාර්යක්ෂමව බෙද හැරීමට ඇති හොඳම ක්‍රමය එයයි. එයින් සිදුවන හානිය නම් ඇති හැකි අයට පමණක් හිඟය ඇති බඩු බෙදී යාමයි. නැති බැරි අයට හුලං ය. මේ අසාධාරණය නවතා බඩු මිළ ද සාධාරණව තබා ගත හැකි ක්‍රමය නම් සලාක ක්‍රමයට බඩු බෙද දීමයි. හාල් පොත්, සලාක පත් අවශ්‍ය වෙන්නේ එවිටය.

රජයට බඩුවක මිළ අඩු කළ හැකි ක්‍රමය නම් ඒ මත පටවා ඇති බදු වෙතොත් ඒවා ඉවත් කිරීමයි. නැතහොත් ඒ සඳහා සහණාධාරයක් ලබා දීමයි. ඒ කොයි එක කළත් එවිට රජයේ ආදයම අඩුවන නිසා අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි සේවා සැපයීම සඳහා කරන වියදම ද අඩු කිරීමට රජයට සිදුවේ.

එද අපේ රටේ ජනතාවගේ ද, මාධ්‍යවේදීන් ගේ ද නුවණ විදහා දක්වන අපූරු නිර්ණායකයක් සපයමින් කිසිවෙකු මේ බව තමන්ගෙන් ම හෝ දේශපාලකයින් ගෙන් හෝ ප්‍රශ්ණ කළේ නැත.

කෙසේ වෙතත්, මැතිවරණය අවසන් වී දින තුනක් තිස්සේ පොලීසියට ද නිවාඩු දෙමින් පැවැත්වුණු මහා අග්නි පූජා වලින් අනතුරුව ඇමති මණ්ඩලය ද නම් කර නව ජේ.ආර්. - තොණ්ඩමාන් රජය පිහිටුවන ලදී. තවත් ටික දිනක් ගතවූ පසු, ඡන්ද පොරොන්දු ගැනම සිතමින් සිටි සැවොම සතුටට පත් කරමින්, පාන් ගෙඩියක මිල ද ශත හැට දක්වා අඩු කරණ ලදී!

> "ඒ ඉස්සර සීයෙ, ශත විසිපහක් ඕනැ වුනේ පාන් කාලක් ගන්න. දැන් අළුත් ආණ්ඩුවෙන් පාන් මිල අඩු කරලයි තියෙන්නේ. ඔය ශත පහලොව හොඳටෝම ඇති!" ඔහු පවසයි.
>
> එතැන සිට කෙටි කතාවේ අවසානය දක්වාම පාඨකයාට කියවන්නට ලැබෙන්නේ ඒ අළුත් ආණ්ඩුවට තිස් තුන් කෝටියක් දෙවි රැකවරණ පතන හිඟන්නා ගේ ආත්ම භාෂණයයි.

ආනන්දයේ නොයෙකුත් ශිෂ්‍ය සංගම්, සංවිධාන, සමාජ ආදිය ඇත. බෞද්ධ සංගමය, අනඳ නුවණ සමාජය, චෙස් ක්ලබ් ඒවායින් මගේ මතකයට නැගෙන කිහිපයකි. මේ සංගම් ශිෂ්‍යයින් ගේ සංවිධානයෙන් ද, සාමාජිකත්වයෙන් ද, ගුරු අනුශාසකයෙකු ගේ අධීක්ෂණයෙන් ද ක්‍රියාත්මක වේ. ආනන්දයේ සිටි සිව් වසරක කාලය තුල මා සාමාජිකත්වය දැරූ එකම සංගමය වූයේ දම් සමාජයයි.

මේ හැම ශිෂ්‍ය සංගමයකට ම දැන්වීම් පුවරුවක් තිබුණි. ලීයෙන් සදූ, වීදුරු දොරක් ඇති, අගුළු සහිත මේ දැන්වීම් පුවරු, පාසලේ එක් විශාල ගොඩනැගිල්ලක බරාඳයේ බිත්ති සහ කුළුණු වල සවිකර තිබුණි. ඒ, ඒ, සංගම්වල නිල නිවේදන, ප්‍රවෘත්ති යනාදිය මෙන්ම ශිෂ්‍යයින් ගේ ගද්‍ය, පද්‍ය සහ චිත්‍ර නිර්මාණ ද මේ පුවරු මගින් ප්‍රදර්ශනය කෙරුණි. සුන්දර ගේය පද රාශියක් රචනා කර ඇති ප්‍රනීත් අබේසුන්දරගේ කවි මා මුලින් ම කියවූයේ ද, තම නිවේදක දක්ෂතා ගැන ද ප්‍රසිද්ධියක් උසුලන දක්ෂ චිත්‍ර ශිල්පියෙකු වන විජය වික්‍රම කරුණාසේන ගේ චිත්‍ර මා මුලින් ම දුටුවේ ද ආනන්දයේ මේ දැන්වීම් පුවරු තුලිනි.

මේ දිනවල සිසුන් ගේ ගද්‍ය පද්‍ය නිර්මාණ සඳහා වෙන්වුනු එක් දැන්වීම් පුවරුවක පල වුණු කෙටිකතාවක් මට කියවීමට ලැබුණි. සුදු කඩදාසි වල අත් අකුරින් ලියා තිබූ, අද මට කතෘගේ නම අමතක වී ඇති, එම කෙටිකතාවේ සාරාංශය මෙයයි.

නගරයේ බස් නැවතුම පොල තම නිවහන කරගනිමින්, මඟීන් ගෙන් හිඟා කා ජීවිතය ගැට ගසා ගන්නා එක්තරා හිඟන්නෙකි. ඔහු තද බල බඩගින්නේ පෙලෙයි. තඹ දෙයිතුවකුදු ඔහු ලඟ නැත. තමා අසලින් යනෙන හැම දෙනෙකුගෙන් ම ඔහු ඉල්ලා සිටින්නේ උදය ආහාරය සඳහා පාන් කාලක් ගැනීමට ශත විසිපහක් දෙන ලෙසය.

අවසානයේ දී හිඟන්නාගේ බෙලෙක් තැටියට යම් මුදලක් වැටේ. එහෙත් ඒ ශත පහළොවක් පමණි. "අනේ මහත්තයෝ, ශත පහළොවෙන් කොහෙමද පාන් කාලක් ගන්නේ, තව ශත දහයක් වත් දෙන්න!" හිඟන්නා මැසිවිලි නගයි.

එවිට ඔහුට ඒ වන විට රටේ සිදුවී තිබෙන "දැවැන්ත වෙනස" ගැන කියා දෙන්නේ ඒ ශත පහළොව පරිත්‍යාග කළ (සමහර විට ආනන්දයේ සිසුවෙකු ද වන) තැනැත්තා ය.

"ඒ ඉස්සර සීයෙ, ශත විසිපහක් ඕනැ වුනේ පාන් කාලක් ගන්න. දැන් අළුත් ආණ්ඩුවෙන් පාන් මිල අඩු කරලයි තියෙන්නේ. ඔය ශත පහළොව හොඳටෝම ඇති!" ඔහු පවසයි.

එතැන සිට කෙටි කතාවේ අවසානය දක්වාම පාඨකයාට කියවන්නට ලැබෙන්නේ ඒ අළුත් ආණ්ඩුවට තිස් තුන් කෝටියක් දෙවි රැකවරණ පතන හිඟන්නා ගේ ආත්ම භාෂණයයි.

මේ අපූරු කෙටි කතාව ලියන ලද්දේ, සත්‍ය සිද්ධියක් ඒ ආකාරයෙන්ම විස්තර කිරීමට දැයි මම නොදනිමි. එය සත්‍ය සිදුවීමක් ම වෙතත්, කෙටිකතාවක වස්තු බීජයක් ලෙස භාවිතා කිරීමට එය කෙතරම් යෝග්‍යදැයි අයෙකුට ප්‍රශ්න කළ හැකිය. වඩාත් ඉඩ තිබුනේ පාන් මිල අඩු වීම නිසා චිත්ත ප්‍රමෝදයට පත් යූ.ඇම්.පී. කාර ශිෂ්‍යයෙකු විසින් මෙම කතාව ප්‍රබන්ධ කර තිබීමටයි. උදාහරණයක් ලෙස, යූ.ඇම්.පී. ය දිනන බවට මා ඇල්ලූ ඔට්ටුවෙන් ලද රුපියල් පහේ දිනුමෙන් දැන් පාන් ගෙඩි පහක් නොව, අටක් සහ අවශ්‍ය නම් තවත් කාලක් ද මිලට ගත හැකි නොවේද? චිත්ත ප්‍රමෝදයෙන් යුතුව කෙටිකතා රචනා කිරීමට තවත් හේතු අවශ්‍යද?

කෙසේ වෙතත් මින් වසර දෙකක් පමණ ගතවෙන විට පාන් ගෙඩියක මිල රුපියල් තුනයි ශත පහක් දක්වා ඉහල ගියේය. විවෘත ආර්ථික රෙජීමය යටතේ රුපියලේ මිල ඩොලරට සාපේක්ෂව අඩුවීම මෙයට හේතුව විය. උද්ධමනය කෙතරම් වීද යත්, හිඟන්නෝ ද ශත පහේ දහයේ කැලි තව දුරටත් ආධාර ලෙස බාර ගැණීම ප්‍රතික්ෂේප කළහ.

එය ද කෙටිකතාවකට සුදුසු මාතෘකාවක් නොවේද?

රසික සූරියආරච්චි
[rasika.suriyaarachchi@gmail.com]

